**හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව - 2020**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

---

## 1.1 අහිතකර මතය

---

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 අහිතකර මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව අහිතකර මතයක් ප්‍රකාශ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) උතුරු මැද පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 2019/02 චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ක්‍රමයට අනුව ඉදිරිපත් කර ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i) ඇ (iii) උප වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂය සමඟ සැසඳිය නොහැක.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව 1.2.2 ඡේදයේ (අ), (ඒ), (ඔ), (ඕ) හා 1.2.3(ආ), (ඇ), (ඊ), (උ), (ඌ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන්වූ විගණන නිරීක්ෂණ**

**1.6.1** **පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 3.13 වන වගන්තියට අනුව ඉදිරිපත් කළ යුතු මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසාන ගිණුම් සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ප්‍රමිතවලට අදාලව ඉදිරිපත් කරන ලද 02 වන පරිශිෂ්ඨයේ E.G 4.22 ඡේදය අනුව දිගු කාලීන ණය ගැනීම්වලට අදාලව, දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබාගත් රු.50,508,825 ක ණය මුදලෙහි පොලී අනුපාතිකය, ණය මුදලේ කාලසීමාව, ණය මුදල ලබාගත් දිනය, ණය මුදල ගෙවිය යුතු දිනය, ණය මුදලේ කොන්දේසි, ණය මුදල ලබා ගත් අරමුණු, තබා ඇති ඇප හා ණය ගිවිසුමේ යම් විශේෂිත කොන්දේසි ඇත්නම් ඒවා මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කළ යුතු වුවද එසේ හෙළිදරව් කර නොතිබුණි. | සියළු විස්තර ඉදිරියේදී හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | පරිශිෂ්ඨයේ සඳහන් පරිදි කටයුතු කළ යුතුය. |

**1.6.2** **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් භාණ්ඩාගාර වාර්තා අනුව පැවති සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම් රු.27,252,951 ක් හා මුද්දර ගාස්තු ආදායම් රු.8,240,021ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | පිළිගනිමි. අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන වලට ගැලපුම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.31,413,952 ක් වටිනා ස්ථාවර වත්කම් දේපල පිරියත උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ලබාදී ඇති උපදෙස් පරිදි ගැලපීම් කටයුතු සිදුකරමි. සමහරක් ගැලපීම් සිදුකර ඇත. | ගිණුම්ගත නොවූ ස්ථාවර වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු පිළිවෙලින් රු.114,600 හා රු.70,000 ක් ගිණුම් ගත කර නොතිබුණි. | පිළිගනිමි. නව ගිණුම මගින් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. | නිවැරදි ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මුදලින් ලැබූ රු.49,183,891 ක කර්මාන්ත ණය ගැති ලැබීම් නොසලකා වර්ෂ අවසාන ණය ගැති ශේෂය ගණනය කර තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම් පොත්පත් යාවත්කාලීනව පවත්වාගත යුතුය. |
| (ඉ) | ප්‍රාදේශීය සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතියට අදාලව රාජ්‍ය බැංකුවක පවත්නා 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරි ශේෂය රු.2,036,341 ක් ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | අදාල වටිනාකම ගිණුම්ගත විය යුතුය. |
| (ඊ) | පළාත් පාලන ආයතන සඳහාවූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ පර්ශිෂ්ඨ 02 ප්‍රකාරව අංක 205 යන කේත අංකය අනුව රු.3,899,826 ක් වටිනා පුස්තකාල පොත් ජංගම වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | පුස්තකාල පොත් ගිණුම්ගත විය යුතුය. |
| (උ) | 2020 දෙසැම්බර් 31 දිනට හිඟ ප්‍රවාරක දැන්වීම් පුවරු ආදායම ලෙස හඳුනාගෙන තිබූ රු.1,673,725 ක් 2019 ජූලි 31 දිනට පැවති හිඟ ආදායම වූ අතර 2019 ජූලි 31 දිනෙන් පසුව 2020 දෙසැම්බර් 31 දින දක්වා හිඟ ආදායම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. අදාල ආයතන වෙතින් මුදල් අයකරගැනීමට කටයුතු කරමි. | නියමිත ආදායම් අයකර ගැනීමට හෝ අනවසර දැන්වීම් පුවරු ගලවා ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 12 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.846,670,763 ක් හා උපලේඛන වාර්තා අනුව වටිනාකම රු.834,892,327 ක් වූයෙන් රු.18,257,792 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | වෙනස්කම් සසඳා ශේෂයන් නිවැරදි කළ යුතුය. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.189,081,395 ක් වූ ගිණුම් විෂයයන් 13 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී මෙවැනි දුර්වලතා ඇති නොවීමට කටයුතු කරමි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව 2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයභාරය ඉක්ම වූ වියදම රු.11,557,729 ක් වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.27,579,736 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | රු.834,801 ක වරිපනම් හා බදු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වරෙන්තු නිකුත් කලද, රටේ පවතින වසංගත තත්වය හේතුවෙන් මිළ මුදල් අඩුපාඩු ඇති නිසා හැකි පමණින් හිඟ මුදල් අයකරගන්නා ලදී. | හිඟ ආදායම් සම්බන්ධව පසුවිපරම් කළ යුතුය. |
| **(ආ)** | **වෙනත් ආදායම්** | | |
| (i). | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඉදිකර තිබූ දුරකථන කුළුණු 18 ක් සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 152 යටතේ දැක්වෙන වෙළඳ ව්‍යාපාර බදු ලෙස වාර්ෂිකව රු.3,000 ක බදු මුදලක් ප්‍රාදේශීය සභාවට අයකර ගත හැකි වුවත්, සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබූ කිසිම දුරකථන කුළුණකින් 2009 වර්ෂයේ සිට එම බදු මුදල් අයකරගෙන නොතිබුණු බැවින්,2020 දෙසැම්බර් 31 දින වන විට රු.432,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | සභා බල ප්‍රදේශයේ කිසිදු කුළුණකින් බදු මුදල් අයකර නොමැත. ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | නියමිත ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |